# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2254/2 - 2021 නොවැම්බර් මස 15 වැනි සඳුදා - 2021.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(4) වගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි; එනම් -

1. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (මෙහි මින්මතු "SDP පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන ඇත්තාවූ ද, එ.ජ.ඩො. මිලියන 650 ක අපේක්ෂිත ආයෝජනයක් සහිතව රාජ්‍ය - පෞද්ගලික - හවුල් ව්‍යාපාරයක් (PPP) වශයෙන් අවුරුදු තිස් පහ (35) ක කාලසීමාවක් සඳහා ඉදිකර, ක්‍රියාත්මක කර, සහ පැවරීමේ (මෙහි මින්මතු "BOT" යනුවෙන් සඳහන් කරනු ලබන) පදනමක් මත කොළඹ වරාය පුළුල් කිරීම යටතේ වූ බටහිර බහාලුම් පර්යන්තය - 1 සංවර්ධනය කිරීමේ සහ මෙහෙයවීමේ ව්‍යාපෘතියට අදාළ තොරතුරු අන්තර්ගත ගැසට් නිවේදනය 2021 ජුලි මස 30 වන දින අංක 2238/39 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

2. එ. ජ. ඩො. මිලියන 650ක අපේක්ෂිත ආයෝජනයක් සහිතව රාජ්‍ය - පෞද්ගලික - හවුල් ව්‍යාපාරයක් (PPP) වශයෙන් අවුරුදු තිස් පහ (35) ක කාලසීමාවක් සඳහා ඉදිකර, ක්‍රියාත්මක කර, සහ පැවරීමේ (BOT) පදනමක් මත කොළඹ වරාය පුළුල් කිරීම යටතේ වූ බටහිර බහාලුම් පර්යන්තය - 1 සංවර්ධන කිරීමේ සහ මෙහෙයවීමේ ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා ඉහත කී පනතේ 3 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 05 වන දින අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය ලබාගෙන ඇත.

3. ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය රාජ්‍ය - පෞද්ගලික - හවුල් ව්‍යාපාරයක් (PPP) වශයෙන් අවුරුදු තිස්පහ (35) ක කාලසීමාවක් සඳහා ඉදිකර, ක්‍රියාත්මක කර, සහ පැවරීමේ (BOT) පදනමක් මත කොළඹ වරාය පුළුල් කිරීම යටතේ වූ බටහිර බහාලුම් පර්යන්තය - 1 සංවර්ධනය කිරීමේ සහ මෙහෙයවීමේ ව්‍යාපෘතිය (මෙහි මින්මතු "ව්‍යාපෘතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් භාරගනු ලබනු ඇත.

1A - PG 5617 – 535 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඉහත කී ව්‍යාපෘතිය පහත දැක්වෙන පරිදි අදියර තුනකින් (03) ක්‍රියාත්මක කර වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලබන බවටද ප්‍රකාශයට පත්කර ඇත.

**I වන අදියර**
ව්‍යාපෘති සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර BOT ගිවිසුම අත්සන් කරනු ලබන දිනයේ සිට ආරම්භව මාස තිස්හය (36) ක කාලසීමාවක් ඇතුළත BOT ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය යටිතල පහසුකම් ද ඇතුළුව මීටර් 600 ක ජැටි බැම්ම සහ පර්යන්ත භූමි ප්‍රදේශය ඉදි කිරීම සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

**II වන අදියර**
BOT ගිවිසුමේ දින සිට ආරම්භව මාස හතලිස්අට (48) ක් ඇතුළත BOT ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය යටිතල පහසුකම් ද ඇතුළුව මීටර් 1,400 ක සම්පූර්ණ දිග ප්‍රමාණයකින් යුත් ජැටි බැම්ම සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

**III වන අදියර**
BOT ගිවිසුමේ දිනයේ සිට ආරම්භව මාස හැට (60) ක කාලසීමාවක් ඇතුළත BOT ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති පර්යන්තය සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

5. මෙම නියමයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බදු නිදහස්කිරීම් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මෙහි මින්මතු " BOI " යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘති සමාගම, එහි කොන්ත්‍රාත්කරුවන් සහ උප කොන්ත්‍රාත්කරුවන් සඳහා අදාළ වන්නේය. එකී බදු නිදහස් කිරීම් අවසන්වීමෙන් පසුව, තත්කාලයේ බලපවත්වනා බදු අදාළ වන්නේය.

## උපලේඛනය

1. **2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

(i) ඉහත කී ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් තුලින් උපචිතවන ලාභ සහ ඉපයීම් මත ව්‍යාපෘති සමාගම සඳහා ආදායම් බදු පැනවීමට අදාළ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ("බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව" යනුවෙන් හඳුන්වනු ලබන) අවුරුදු විසිපහ (25) ක කාලසීමාවක් සඳහා අදාළ නොවිය යුතුය.

එකී බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව, ව්‍යාපෘති සමාගම විසින් බදු අයකළ හැකි ලාභ ඉපයීම සිදුකරනු ලබන පළමු වර්ෂයේ සිට හෝ ව්‍යාපෘති සමාගම විසින් ස්වකීය වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් පසුව එළඹෙන අවුරුදු දෙකක (02) කාලසීමාවක සිට යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාවේ සිට ආරම්භ විය යුතුය.

එසේ වුවද, ඉහත කී බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව අවසන් වීමෙන් පසුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘති සමාගමේ ලාභ, ඉපයීම් සහ ආදායම් සම්බන්ධ තත්කාලයේ බල පවත්නා ආදායම් බදු ගෙවනු ලැබිය යුතුය.

(ii) බදු නිදහස් ලාභ සහ ඉපයීම් තුළින් කොටස් හිමියන් වෙත බෙදා හරිනු ලබන සහ ඔවුන් විසින් ලබාගන්නා ලාභාංශ, ඉහත කී අවුරුදු විසිපහ (25) ක බදු ගෙවීමෙන් නිදහස් කාලසීමාව තුළදී සහ ඉන්පසුව එක් අවුරුද්දක (01) කාලසීමාවක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වන්නේය.

(iii) අ ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගන්නා විදේශ ණය මත වූ පොලිය මත;
ආ ව්‍යාපෘතියේ සේවයේ නියුක්ත උපදේශකරුවන් සඳහා ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු මත;
රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

(iv) ඉහත කී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සේවා නියුක්තියෙන් ලැබෙන ඉපයීම් සහ ලාභය මත අවුරුදු පහ (05) ක කාලසීමාවක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් විසි (20) දෙනෙකුට යටත්ව ව්‍යාපෘති සමාගමේ විදේශීය සේවා නියුක්තිකයන් නිදහස් වන්නේය.

2. **2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත (VAT බදු පනත)**

BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන භාණ්ඩ, BOT ගිවිසුමේ සඳහන් දින සිට ආරම්භව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවුරුදු පහ (05) ක කාලසීමාව තුළදී, එකතු කළ අගය මත බදු (VAT බදු) ගෙවීමෙන් නිදහස් වන්නේය.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළදී සිදු කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ හෝ සේවා දේශීය වශයෙන් මිලදී ගැනීම් සඳහා වූ එකතු කළ අගය මත බදු විලම්භනය කරනු ලැබේ.

සපයනු ලබන සේවාවන් VAT බදු පනතේ 7 වන වගන්තියේ 1 වන උප වගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදයන්හි සඳහන් විධිවිධානවලට අයත්වේ නම්, ඉන්පසුව VAT බදු ගෙවීම ශුන්‍ය අගයක් ගනු ලබයි. ශුන්‍ය අගයන් ගනු ලබන සේවාවන් හැර, සෙසු සේවාවන් සාමාන්‍ය අනුපාතිකය යටතේ VAT බදු ගෙවීමට යටත් වන්නේය.

3. **2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත.**
BOT ගිවිසුමේ දින සිට ආරම්භව අවුරුදු පහ (05) ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළදී ආනයනය කරනු ලබන BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ මත, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු (PAL) ගෙවීමෙන් සහ අයකිරීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

4. **1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**
BOT ගිවිසුමේ දින සිට ආරම්භව අවුරුදු පහ (05) ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළදී, BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන අයිතම, සෙස් බද්ද (CESS) ගෙවීමෙන් නිදහස් වන්නේය.

5. **රේගු ආඥාපනත (235 වන අධිකාරය)**
BOT ගිවිසුමේ දිනයේ සිට අවුරුදු පහ (05) ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළදී, BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම අයිතම (මුදල් අමාත්‍යාංශය මඟින් ප්‍රකාශයට පත් කරන ලද අසාදු ලේඛනයේ සඳහන් අයිතම හැර) ආනයනය කිරීම් මත රේගු බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

එසේ වුවද, අසාදු ලේඛනයේ සඳහන් අයිතම ශ්‍රී ලංකාව තුල සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරනු නොලබයි නම් හෝ එම අයිතම ප්‍රමාණවත් තත්ත්වයෙන්, ප්‍රමාණවලින් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ලබා දී ඇති කාලසීමාව තුළදී ලබාගැනීමට නොමැති අවස්ථාවකදී, එම අසාදු ලේඛනයේ සඳහන් අයිතම ආනයනය කිරීම පිළිබඳව BOI විසින් සලකා බලනු ලැබිය යුතුය.

**මහින්ද රාජපක්ෂ, පා. ම.,**

ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය.

2021 නොවැම්බර් මස 15 වන දින,
ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ දී ය.

11-688

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.